# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීම්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රියදුරු තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(1) **බඳවා ගැනීමේ සුදුසුකම් :**

**අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් / පළපුරුද්ද**

**අධ්‍යාපන සුදුසුකම් :**

- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**වෘත්තීය සුදුසුකම් :**

- පෞද්ගලික / කුලී රථ සහ භාර බර හොන්ඩර 240 අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

  (බඳවාගන්නා දිනට වසර 3කට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය)

- මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබීම.

**පළපුරුද්ද :**

- වාහන රියදුරෙකු ලෙස වසර 03ක සේවා පළපුරුද්දක් ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

(2) **වයස - අවු. 18-45 අතර විය යුතුය**

(3) **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර, පත්කිරීම් සිදුකරනු ලබන්නේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය යන දෙකම සඳහා ලබාගත් ලකුණු පදනම් කරගෙනය.

(4) **වැටුප:- TRC 10.1 - රු.40,800/- (10x480) - (10x680) - (10x1020) - (10x1360) - රු.76,200/-**

(5) **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය - 2023.08.10**

(6) **පොදු කොන්දේසි :**

- මෙම පත්වීම ස්ථිර පත්වීමක් වන අතර වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අදාළ සුදුසුකම් සපුරා නොමැති සහ අයදුම්පත සමග නියමිත පරිදි සහතික කරන ලද අදාල සහතිකවල පිටපත් ඉදිරිපත් කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.
- බඳවාගනු ලබන තනතුරු ප්‍රමාණය හෝ බඳවා ගැනීම කල්දැමීම / අවලංගු කිරීම් පිළිබඳව තීරණ ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුය.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යනු නියාමන ආයතනයක් වන බැවින් එහි සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තෙකු විසින් ඔහුගේ/ඇයගේ කළත්‍රයා හෝ පවුලේ සාමාජිකයෙකු කොමිෂන් සභාවේ නියාමන පාලනය යටතේ පවත්නා ආයතනයක තනතුරකට බඳවා ගැනීම හෝ පත්කිරීමට සෘජුව හෝ වක්‍රව අනුබල දීම/දිරි ගැන්වීම හෝ පෙනී සිටීම සිදු නොකළ යුතුය.

(7) **අයදුම්කරන ක්‍රමය :**

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කළ අයදුම්පත්, අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳව අදාල සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරු දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් තනතුර සඳහා තෝරාගත හොත් මුදාහැරීමට බාධාවක් නොමැති බවට අදාල ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"රියදුරු තනතුර සඳහා බඳවාගැනීම - 2023"** ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් **www.trc.gov.lk** වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රියදුරු තනතුර සඳහා අයදුම්පත්‍රය - 2023**

- සම්පූර්ණ නම (සිංහල/දෙමළ) :
- සම්පූර්ණ නම (ඉංග්‍රීසි) :
- මුලකුරු සමග නම(ඉංග්‍රීසි) :
- ලිපිනය
- ස්ත්‍රී/පුරුෂ භාවය :
- දැනටමත් රජයේ සේවයේ නියුතු අයෙක් නම් - වර්තමාන තනතුර සේවය කරන ආයතනය
- උපන් දිනය :
- වයස (අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට) : අවුරුදු: .......... මාස: ............. දින: ..............
- දුරකථන අංකය : ජංගම - නිවස -
- ජාතික හැඳුනුම්පත්/ගමන් බලපත්‍ර අංකය :
- අධ්‍යාපන සුදුසුකම් :
- වෘත්තීය සුදුසුකම් :
- වෙනත් සුදුසුකම් :
- අමුණා ඇති සහතික පිටපත් 1.
  2.
  3.
  4.

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය : ................/ .........../ ............... අයදුම්කරුගේ අත්සන : ..........................................................

- නිලධාරියා සේවය කරන ආයතනයේ ප්‍රධානීගේ නිර්දේශය: ඉහත තනතුර සඳහා තෝරාගත හොත් නිලධාරියා මුදාහැරීමට බාධාවක් නොමැති බවට නිර්දේශ කරමි.

දිනය : ................/ .........../ ............... ආයතන ප්‍රධානීගේ අත්සන : ..........................................................

නම:

තනතුර :

වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
276,
ඇල්විටිගල මාවත,
කොළඹ 08.